"ශානි අබේසේකර 'පාස්කු සාක්ෂි' ඇමරිකාවට පන්නයි" යන සිරස්තලයෙන් යුතුව සැප්තැම්බර් 20 දිවයින පුවත්පතේ පළවූ වාර්තාවකි. මෙහි කිසිදු නිශ්චිත මූලාශ්‍රයන් සඳහන් කිරීමකින් තොරව කරුණු දක්වා ඇති අතර, සඳහන් වන එකම මූලාශ්‍රයද 'ඉහළ පෙළේ ආරක්ෂක ආරංචි මාර්ග' වේ.

මෙහිදී පාඨකයින් ලෙසින් අප ඇසිය යුතු පැනයන් දෙකකි.

ජාතික ආරක්ෂාවටද අදාළව මෙම දක්වා ඇති කරුණු සඳහා විශ්වසනීය මූලාශ්‍රයන් තිබේද? අඩු තරමින් එම තොරතුරු බහුමූලාශ්‍ර ඔස්සේ තහවුරු කරගෙන තිබේද? මූලාශ්‍රය හෙළිකිරීමට මූලාශ්‍රයෙන් අවසරයක් නොලැබෙන අවස්ථාවකදී, මූලාශ්‍රයේ අනන්‍යතාවය මාධ්‍යවේදියා විසින් ආරක්ෂා කළ යුතු බවට විවාදයක් නොමැත. නමුත් එවන් අවස්ථාවකදී පවා තමන් ඉදිරිපත් කරන කරුණු කාරණා ඔප්පු කිරීමට සාක්ෂි සාධක මාධ්‍යවේදියා සතුව තිබිය යුතු වේ. මෙය අනිද්දා පුවත්පතේ ලිපියක (අලුත් අනතුරු සංඥා කියාදෙන මාධ්‍යවේදියා අත්අඩංගුවට ගැනීම - 2020.09.06) මාධ්‍යවේදී ලසන්ත රුහුණගේ විසින්ද පෙන්වා දී තිබිණි.

ශානි අබේසේකර සම්බන්ධ නීතිමය කටයුතු තවමත් සිදුවෙමින් පවතී. එසේ නම් දිවයින වාර්තාවේ දැක්වෙන කරුණු කාරණාවන් නීති ක්‍රියාවලිය ඔස්සේ හෙළිදරවු වී, සනාථ වී තිබේද? එසේ නොමැතිනම්, දිවයින පුවත්පත 'ශානි අබේසේකර පාස්කු සාක්ෂි ඇමරිකාවට පන්නයි' වැනි සිරස්තලයක් ඔස්සේ නීතිය ඉදිරියේ තවමත් සැකකරුවෙකු වන අයෙකු, නීතිය ඉදිරියේ තවමත් විභාග වන කරුණක් සම්බන්ධයෙන් වරදකරුවෙකු ලෙසින් නම් කරන්නේ කුමන පදනමකින්ද?
**#MediaEthicsSL** **#lka** **#SinhalaPress** **#SundayDivaina**
See Less